**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II - 2020**

---

**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ - සංරචක II හි 2020 දෙසැම්බර් 31 ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2018 මැයි 16 දින එළඹි අංක. 8878 එල්කේ දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.**

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

**ණය ගිවිසුම අනුව, එවකට පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගයෙන් එවකට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ තෝරාගත් ප්‍රදේශවල ඉහළ අවදානම් සහිත ජන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම අවධාරණය කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල භාවිතය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. (අ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම (ආ) නවෝත්පාදන ප්‍රදාන සහ ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම (ඇ) අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර දැක්වීම නමින් වූ කොටස් තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 697,936.86 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 4,419 ක් වන අතර ඉන් රු.මිලියන 31,588 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟවී තිබුණි. එයින් රු.මිලියන 2,245.12 ට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 14.22 ක් ව්‍යාපෘතියේ සංරචක - II යටතේ සිදුකිරීමට නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහය සහ නවෝත්පාදන ප්‍රදාන සඳහා වෙන් කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.**

**1.3 මතය**

---

**මූල්‍ය ප්‍රකශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** ව්‍යාපෘතියේ කටයුතු වල ප්‍රගතිය

-----------------------------------

**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියෙහි සංරචකය II උප සංරචක 04 කින් සමන්විත වන අතර, මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඍජුව සහාය දැක්වීම හා රටෙහි සාමාන්‍ය රාජ්‍ය මූල්‍ය කළමණාකරණය හරහා ක්‍රියාත්මක කිරීම අසීරු කටයුතු සඳහා ප්‍රතිපාදන සැපයීම සිදු කරයි. මූලිකව, ව්‍යාපෘතියෙහි කටයුතු සිදු කිරීම සඳහා, සංරචකය II සඳහා එ.ජ. ඩොලර් මිලියන 14.22 ක් වෙන් කර තිබුණි. රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේදී මෙම මුදල එ.ජ. ඩොලර් මිලියන 5.22 ක් දක්වා අඩු කර තිබුණි. ඉන් එ.ජ. ඩොලර් මිලියන 1.03 ක් 2020 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියෙහි කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.**